**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල - 2022**

**-------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

### 1.5.2

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් මුළු ආදායම රු.506,595,988 ක් වුවද, ඒ සඳහා ඉදිරිපත් කළ ආදායම් වාර්තාවෙහි ඇතුළත් සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.535,090,363 ක් වූයෙන් රු.28,494,375 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ සමස්ත ආදායම රු.535,090,363 ක් වුවත් මෙහි ඇතුළත් වැට් බදු මුදල් සහ වෙනත් සංශෝධන සිදුකළ පසු ශුද්ධ ආදායම ගිණුම් ගත කර ඇති බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා ඇති ආදායම ආදායම් වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සමරු අලෙවිසැලේ සමාලෝචිත වර්ෂයේ විකුණුම් වටිනාකම රු.5,850 ක් වුවද, | විකුණුම් පිරිවැය නිවැරදිව ගැලපීමට කටයුතු කරන බව. | විකුණුම් පිරිවැය නිවැරදිව ගණනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එහි විකුණුම් පිරිවැය රු.1,041,402 ක් වශයෙන් දක්වා තිබුණි. නොමිලේ ලබා දුන් රු.1,132,320 ක් වටිනා සමරු කලාප 12,108 ක් දළ ලාභයෙන් අඩු කිරීමට කටයුතු නොකර විකුණුම් පිරිවැයට එකතු කර දක්වා තිබීම ඊට හේතුව බවට නිරීක්ෂණය විය. | | |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අරමුදලේ ශේෂය රු.1,977,037,550 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම ශේෂය රු.2,009,522,432 ක් වශයෙන් රු.32,484,882 ක් වැඩියෙන් දැක්වුණි. වසර ගණනාවක් තිස්සේ පවතින මෙම වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු හා කොන්ත්‍රාත් රඳවා ගැනීම් වැනි ගනුදෙනු මත මෙම වෙනස ඇති වන බව. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති අරමුදලේ ශේෂය භාණ්ඩාගාරයේ ඇති ශේෂය සැදීම් කර වෙනස නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 සැප්තැම්බර් 22 දිනැති අංක MSDW/F/1/3/GEN දරන තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය පරිදි ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සත්වෝද්‍යානවලට හා සෆාරි උද්‍යානයට ඇතුලුවීමේදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර ඇති ගාස්තුව සඳහා නරඹන්නන්ගෙන් එකතු කළ අගය මත බදු අය කිරීමට කටයුතු නොකර ප්‍රවේශ පත්‍ර ගාස්තුවෙන් බදු මුදල අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ ආකාරයට සමාලෝචිත වර්ෂයේ අය කළ රු.471,171,300 ක ප්‍රවේශ පත්‍ර ගාස්තුවෙන් අඩු කර ගෙවනු ලැබූ රු.56,406,780 | අමාත්‍යාංශ ලේකම් සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට කරුණු දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේ දී ගන්නා බව. | එකතු කළ අගය මත බදු පනතේ විධි විධාන පරිදි ටිකට්පත් ගාස්තුවට බදු මුදල් ගණනය කිරීම එකතු කර අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක එකතු කළ අගය මත බදු හේතුවෙන් අරමුදලට එම ආදායම අහිමි වී තිබුණි. | | |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඖෂධ ගබඩාවේ පැවති වටිනාකම රු.393,650 ක් වූ ඖෂධ වර්ග 157 ක් ඖෂධ තොගයට ඇතුළත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පවත්නා සියලුම තොග භෞතිකව සමීක්ෂණය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසෙහි 15.1ඡේදය යටතේ වන මාර්ගෝපදේශ අංක 04 | | | |
| (අ) 03 වන මාර්ගෝපදේශය | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව ඉදිරිපත් කළ යුතු කාර්තුමය වාර්තා 07 ක් සකස් කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 දෙවන කාර්තුවේ සිට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අදාළ කාර්තුමය වාර්තා නියමිත පරිදි සකස් කර අදාළ අංශයන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 4.2 හා 5.2 (ආ) මාර්ගෝපදේශයන් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරමින් සකස් කළ යුතු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය වෙනුවට ආදායම් ප්‍රකාශනයක් ඉදිරිපත් කර තිබුණි. | 2023 වර්ෂයේ සිට අදාළ ආකෘතියට අනුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 5.1 මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | 6(ආ) මාර්ගෝපදේශය | සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවද, සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට භාෂා ත්‍රිත්වයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | භාෂා ත්‍රිත්වයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | 07 වන මාර්ගෝපදේශය හා මුදල් රෙගුලාසි 877 (2)(ඈ) | ගිණුම් සමඟ අයවැය සැසඳුම් ලේඛනය ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන සමඟ අයවැය සැසඳුම් ලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.429,958,380 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.558,081,259 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.128,122,879 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී සත්වෝද්‍යාන නැරඹීමට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව වැඩි වීම තුළින් ප්‍රවේශ පත්‍ර ආදායම ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක සත්වෝද්‍යාන හා මින් මැදුරු පිළිබඳ සංගමය විසින් 2015 වර්ෂයේදී යාවත්කාලීන කරන ලද සත්ව සුභසාධන උපාය මාර්ගයන්හි ඇතුළත් ආචාරධර්ම පද්ධතියේ 11 වන ඡේදය ප්‍රකාරව රැකවරණය තුළ සිටින සත්වයන්ගේ මරණ සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් සිදු නොකිරීමට ප්‍රබල හේතුවක් ඇති අවස්ථාවකදී හැර අනෙකුත් සෑම අවස්ථාවකදීම මරණ | 2015 වසරේදී යාවත්කාලීන වී ඇති ආචාරධර්ම පද්ධතිය අනුව මරණ පරීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකරන ලද සතුන්ගේ මරණවල නිශ්චිත හේතුව හෝ මරණය සිදු වූ ආකාරය දැන සිටීම මරණ පරීක්ෂණයක් සිදු නොකිරීමට හේතු සාධක වී ඇත. | මරණ පරීක්ෂණ නොපැවැත්වීමට හේතු දක්වමින් මිය ගිය සතුන් පිළිබඳ වාර්තා පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂණයක් සිදු කළ යුතුය. එසේ වුවද, 2021 වර්ෂයේ වර්ග 13 කට අයත් සතුන් 18 දෙනෙකුගේ මරණවලට ප්‍රබල හේතුවක් ඇති බවට සනාථ කර නොතිබුණු අතර මරණ පරීක්ෂණයන් ද සිදු කර නොතිබුණි. | | |
| (ආ) | 2021 වර්ෂයේ දී නිකුත් කරන ලද සත්ව තක්සේරු වාර්තාවෙහි සත්ව මරණ 13 ක් ඇතුළත් කර නොතිබීමත්, මිය ගිය සත්ව වර්ග 09 ක ප්‍රමාණයන්හි වෙනස්කම් පවතින බවට නිරීක්ෂණය වීමත් හේතුවෙන් සත්ව තක්සේරු වාර්තාවෙහි ඇතුළත් සත්ව මරණ සංඛ්‍යාව නිවැරදි බවට සනාථ කළ නොහැකි විය. | සති 2 කට අඩු සත්ත්ව මරණ වාර්තා අතරට ගනු නොලැබීම මෙයට හේතුව වී ඇති අතර මියයන සතුන්ගේ මිය යාමට බලපාන ලද හේතුව නිශ්චිතවම දන්නේ නම් මරණ පරීක්ෂණ සිදුනොකරයි. | මරණ පරීක්ෂණ නොපැවැත්වීමට හේතු දක්වමින් මිය ගිය සතුන් පිළිබඳ වාර්තා පවත්වා ගත යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේදී යාවත්කාලීන කරන ලද සත්ව සුභසාධන උපායමාර්ගයන්හි ඇතුළත් ආචාරධර්ම පද්ධතියේ 03 වන ඡේදයේ සඳහන් සතුන් ප්‍රදර්ශනය කිරීමේ ප්‍රමිතය ප්‍රකාරව සතුන්ගේ ආරක්ෂාව සැලසෙන පරිදි සතුන් ප්‍රදර්ශනය කළ යුතුය. එසේ වුවද, 2021 හා 2022 වර්ෂයන්ට අදාළව සිදු කළ පරීක්ෂාවේදී අවස්ථා 09 කදී සතුන් මියගිය බව කල්ගත වී හඳුනාගෙන තිබීම, සතුන් පස් දෙනෙකු ප්‍රතිප්‍රහාරයන්ට ලක්ව මිය ගොස් තිබීම, සමස්ත සත්ව මරණ 156 න් 96 ක දීම සතුන්ගේ රෝග හඳුනාගැනීමක් හෝ ප්‍රතිකාර ලබා දීමක් සිදුකර නොතිබීම හා ළදරු සත්ව මරණ අනුපාතය ප්‍රතිශතයක් ලෙස සියයට 8.3 ක සිට සියයට 26.38 ක් දක්වා ඉහළ ගොස් තිබීම යනාදී කරුණු අනුව සතුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි කටයුතු කළ බවට නිරීක්ෂණය නොවිය. | සමහර සතුන්ගේ සිරුරු මරණයෙන් පසු ඉතා ඉක්මනින් දිරාපත්වීම සිදුවේ. විලෝපික ප්‍රහාරයන්ගෙන් මියයෑම ඉතා අවම මට්ටමක පවතී. සත්ත්වභාරකරුවන්ගේ දෛනික දින සටහන් සහ පශු වෛද්‍යවරුන් විසින්ම යොදන ලද දින සටහන් හා සැසඳීමේදී යම් වාර්තාකරණ දෝෂ සිදු වී තිබෙන අතර ප්‍රතිකාර ලබා නොදීමට හේතුව හදිසි මරණ, ඉතා කුඩා සතුන්ගේ මරණ සහ ඉතා වයස්ගත සතුන්ගේ මරණ ආදිය වේ. ඉතා කුඩා කුරුළු පැටවුන්ගේ මරණ සහ නූපන් මරණ (still births) සඳහා ප්‍රතිකාර කර නොමැති අතර කුඩා සතෙකු ඉපදුණු විට එම සත්ත්වයා සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලබන ආකාරය පිළිබඳව වැඩ පිළිවෙලක් සකසා ක්‍රියාත්මක වීම සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | සතුන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ කටයුතු හා ප්‍රතිකාර කටයුතු වැඩිදියුණු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂයේදී රු.1,398,000 ක පිරිවැයක් දරමින් සුදු මොණරුන් 04 දෙනෙක් මිළදී ගෙන 2022 වර්ෂයේදී අභිජනන ක්‍රියාවලිය මගින් පැටවුන් බෝ කිරීමට ක්‍රියාකර ඇතත් 2022 ජූලි මස 31 දින සිට 2022 ඔක්තෝම්බර් මස 03 දින දක්වා වූ මාස 02 ක පමණ කෙටි කාලයක් තුළ එයින් එක් මොණරකු හා සුදු මොණර පැටවුන් පස්දෙනෙකු මිය ගොස් තිබූ බවට නිරීක්ෂණය විය. | පෙනහළු රෝගයකිනුත් එක් මොණර පැටවෙකුත්, ඉතිරි පැටවුන් සිවු දෙනා සහ වැඩිහිටි මොණරා coccidiosis රෝගයෙනුත් මිය ගොස් ඇත. protozoa නම් රෝග කාරකයෙකු මගින් වැළදී සතුන්ගේ අන්ත්‍ර ආසාධනය කරනු ලබන මෙම රෝගය සඳහා ප්‍රතිකාර කිරීම ඉතා දුෂ්කර වේ. | සතුන්ගේ සෞඛ්‍ය හා ප්‍රතිකාර ක්‍රමයන් තව දුරටත් වර්ධනය කළ යුතුය. |
| (ඉ) | බෝවන රෝගයක් වැළඳුනු සතුන් නීරෝගී සතුන්ගෙන් ඉවත් කර නිරෝධායනය කිරීම සඳහා දෙහිවල සත්වෝද්‍යානය තුළ නිරෝධායනය මධ්‍යස්ථානයක් නොතිබුණු අතර ගෝණපළ ඉදිකරමින් පවත්නා නිරෝධායන මධ්‍යස්ථානයේ කටයුතු අවසන් කර නොතිබුණි. | දෙහිවල සත්වෝද්‍යානයේ බෝවන රෝග වැලඳෙන සතුන් නිරෝධායනය කිරීම සඳහා ගෝනපොල ගොවිපොල තුළ ඉදිකරමින් පවතින නිරෝධායන මධ්‍යස්ථානයේ සියයට 70 ක පමණ ප්‍රමාණයක් ඉදිකර අවසන් කර ඇත. | නියමිත කාලය තුළ ඉදිකිරීම් අවසන් කර නිසි ආකාරයට සත්ත්ව නිරෝධානයන මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යා යුතුය. |
| (ඊ) | 2015 වර්ෂයේදී යාවත්කාලීන කරන ලද සත්ව සුභසාධන උපායමාර්ගයන්හි ඇතුළත් ආචාරධර්ම පද්ධතියේ 03 වන ඡේදයේ සඳහන් වන ප්‍රදර්ශන ප්‍රමිති ප්‍රකාරව සත්වෝද්‍යානය තුළ සතුන්ට ස්වභාවික හැසිරීම් සඳහා අවශ්‍ය පරිසරය සකස් කර දිය යුතුය. එසේ වුවද, 2022 වර්ෂයේ දෙසැම්බර් මස 20 දින වන විට දෙහිවල සත්වෝද්‍යානය තුළ තම කුඩුව තුළ තනිව ජීවත් වන සත්වයින් 15 දෙනෙක් ද, සහකරුවන් නොමැති සත්වයින් 35 දෙනෙක් හා සහකාරියන් නොමැති සත්වයින් 21 දෙනෙක් ද, සිටින බවට නිරීක්ෂණය වූ අතර 2022 මාර්තු 09 වන දින මිය ගිය ජපන් වඳුරා (ගැහැණු සතෙකු) වසර 15 ක සිට තනිව ජීවත්ව සිටීම නිසා මානසික අවපීඩන තත්ත්වයකට Depressive Condition ගොදුරු වී පිළිකා සෛල Urine Cancer උග්‍ර කිරීමට බලපෑ හැකි බවට පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවෙහි සඳහන් කර තිබුණි. ඒ අනුව සතුන් තනිව ජීවත් වීම එම සත්වයින්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යයට දැඩි බලපෑමක් කළ හැකි බවට නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ අග භාගයේ සිට අප විසින් විවිධ අන්තර්ජාතික සත්ත්ව හුවමාරු වැඩසටහන් සඳහා මූලික පියවර ගනිමින් සිටිමු. මේ යටතේ කළු ජගුවර් සඳහා මේ වන විට සහකරුවෙකු ලැබී ඇත. | ආචාරධර්මන්ට අනුකූල වෙමින් සත්ත්ව සුබසාධනය වැඩි කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ 2022 වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව 2022 දෙසැම්බර් 23 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීමක් මත නැවත සංශෝධනය කර තිබුණි. එසේ වුවද, එම සංශෝධිත අයවැය ඇස්තමේන්තුව තුළ ඇතුළත් අයවැයගත වියදම හා තථ්‍ය වියදම සැසඳීමේදී වියදම් ශීර්ෂ 03 ක සියයට 0.9 ක සිට සියයට 39.4 ක් දක්වා වූ ප්‍රතිශතයකින් අනුමත අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි. | මෙම වර්ෂයේ සිට මෙම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කරන බව. | අනුමත අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් නොදැරිය යුතුය. |
| (ආ) | 2022 වර්ෂය සඳහා අධ්‍යාපන හා පර්යේෂණ වෙනුවෙන් මූලික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කළ රු.25,000 ක මුදලක් සංශෝධිත ඇස්තමේන්තුව මඟින් රු.1,025,000 ක් දක්වා රු.1,000,000 කින් වැඩි කර ගෙන තිබුණු නමුත් වර්ෂය තුළදී අධ්‍යාපන හා පර්යේෂණ සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. | අධ්‍යාපන හා පර්යේෂණ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබූ බැවින් ප්‍රතිපාදන වැඩි කිරීමට කටයුතු කර ඇති නමුත් 2022 වර්ෂයේ පැවති කාලය ප්‍රමාණවත් නොවීමෙන් ප්‍රතිපාදන භාවිතා කිරීමට නොහැකි වී ඇත. | තාත්වික පදනමක් මත අයවැය ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුය. |